රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99 (XXXIII)

මගේ අංකය : EST-6/TPORT/05/1010-1
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.11.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම්</u>**

"රජයේ නිලධාරීන්/ අධිකරණ නිලධාරීන්/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්" මැයෙන් නිකුත් කරන ලද 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 1:3 උප ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**1:3 නියෝජ්‍ය/ සහකාර මට්ටමේ තනතුරු දරන රාජ්‍ය නිලධරයන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම.**

1:3:1 වාහන සහ ඒ සඳහා ඉන්ධන ප්‍රතිපාදනය කිරීමට හැකියාවක් ඇත්නම් පමණක්, සේවයේ අවශ්‍යතාව මත කාර්යාලය හා නිවස ආසන්න ස්ථාන අතර ගමන් කිරීම සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි පහත සඳහන් අයට ලබා දීමට හැකිය. මෙහිදී ගමන් ස්ථාන දෙක අතර උපරිම දුර ප්‍රමාණය කිලෝමීටර් 50 නොඉක්ම විය යුතුය. එවැනි වාහනයක් රාත්‍රී කාලයේ දී නවතා තැබිය යුතු ස්ථානය ආයතන ප්‍රධානියා විසින් නියම කළ යුතුය.

(I) කැබිනට් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය කොමසාරිස්, නියෝජ්‍ය පාලක, සහකාර අධ්‍යක්ෂ, සහකාර කොමසාරිස්, සහකාර පාලක වැනි හා ඒ හා සමාන තනතුරු දරන, කිසියම් දීප ව්‍යාප්ත සේවයක I, II, III ශ්‍රේණිවලට අයත් හෝ ඊට සමාන වෙනත් සේවාවල නිලධරයන්.

(II) පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලවල, පළාත් අමාත්‍යාංශවල හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය මට්ටමේ/ සහකාර මට්ටමේ තනතුරු දරන දීප ව්‍යාප්ත සේවයක I, II, III ශ්‍රේණිවලට අයත් හෝ ඊට සමාන වෙනත් සේවාවල නිලධරයන්.

02. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය